දුරකථන
தொலைபேசி
Telephone
2698471
2698475
2698490

ෆැක්ස්
பெக்ஸ்
Fax
2693866

විද්‍යුත් තැපැල
இணையத்தளம்;
E mail
postmaster@health.gov.lk

මගේ අංකය
எனது இல
My No.
NCD /inj / 09 / 2021

ඔබේ අංකය
உமது இல
Your No. :

දිනය
திகதி
Date
20 .05.2022

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA
සෞඛ්‍ය අමාත්‍යංශය

පොදු චක්‍රලේඛ අංක: 02- 43 /2022

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
පළාත් / ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂවරුන්,
ශික්‍ෂණ රෝහල්, පළාත් මහ රෝහල් , දිස්ත්‍රික් මහ රෝහල් අධ්‍යක්‍ෂවරුන්,
මූලික රෝහල් වෛද්‍ය අධිකාරිවරුන් සහ
ආයතන ප්‍රධානීන්.

**ජාතික විෂ නිවාරණ සතිය - 2022 සැප්තැම්බර් 19 – 25 දක්වා**
**"ශ්‍රී ලංකාවේ බහුලව සිදුවන විෂවීම් වළක්වා ගනිමු. "**

ජාතික විෂ නිවාරණ සතිය, ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනතුරු වැළැක්වීමේ ජාතික කේන්ද්‍රීය ඒකකය වන බෝ නොවන රෝග ඒකකය හා ඒකාබද්ධව පසුගිය වසර කිහිපය මුළුල්ලේ වාර්ෂිකව පවත්වා ගෙන යනු ලබන ජාතික සෞඛ්‍ය වැඩපිළිවෙලකි. අනතුරු වැළැක්වීමේ ජාතික කමිටුව මඟින් 2007 වර්ෂයේ ගත් තීරණයක් අනුව මෙම වැඩසටහන ආරම්භ විය.

ජාතික සෞඛ්‍ය සංඛ්‍යා ලේඛනවලට අනුව, 2010 සිට 2019 දක්වා විවිධ විෂ ශරීරගතවීම් හේතුවෙන් නේවාසික ප්‍රතිකාර සඳහා රජයේ රෝහල්වලට ඇතුළත් වූ රෝගීන්ගේ මුළු සංඛ්‍යාව **1,060,333**කි .මොවුන් අතුරින් ඖෂධීය විෂවීම් නිසා රෝහල් ගත වූ සංඛ්‍යාව **23.2% ( 245,803)** ද, පළිබෝධනාශක විෂවීම් නිසා රෝහල් ගත වූ සංඛ්‍යාව **14.3% (151,807)** ද, සර්ප දෂ්ටන නිසා රෝහල් ගත වූවන්ගේ සංඛ්‍යාව **30% (339,054)** ක් වන අතර ඖෂධීය නොවන අනෙකුත් ද්‍රව්‍යවල විෂ වීම් නිසා රෝහල්ගතවූවන් ගණන **30.5% ( 323,869)**කි. ඒ අනුව විෂවීම් හේතුකොටගෙන සිදුවන රෝහල්ගතවීම් හා මරණ අවම කර ගැනීම උදෙසා **2022** වර්ෂය තුළ ජනතාව නිසිපරිදි දැනුවත් කිරීම, සෞඛ්‍ය සේවා ආයතන පද්ධතින් හරහා සිදු කිරීම මෙකී චක්‍රලේඛය නිකුත් කිරීමේ අභිප්‍රාය වෙයි.

**2022** වර්ෂයේදී විෂ නිවාරණ සතියේ තේමාව,

**"ශ්‍රී ලංකාවේ බහුලව සිදුවන විෂවීම් වළක්වා ගනිමු".**

**නියමිත කාල වකවානුව - 2022 සැප්තැම්බර් 19-25**

අරමුණු-

1. විෂවීම් හේතුවෙන් රෝහල්ගත වන සංඛ්‍යාව හා මරණ සංඛ්‍යාව අවම කර ගැනීම.
2. විෂවීම් අවම කර ගැනීමේ ක්‍රම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම.

**යෝජිත කාර්යයන් -**

කාර්ය මණ්ඩල සාමාජිකයින් හා ප්‍රජාව දැනුවත් කිරීමට ක්‍රියාකාරි වැඩපිළිවෙලක් ආයතනය තුල සංවිධානය කිරීම.

1. දේශන සහ ප්‍රදර්ශන පැවැත්වීම
2. අත්පත්‍රිකා හා පෝස්ටර් බෙදා හැරීම

මෙම වැඩසටහන සම්බන්ධීකරණය කරනු ලබන කොළඹ ශ්‍රී ලංකා ජාතික රෝහලේ ස්ථාපිත ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය වෙතින් උපදෙස් හා මාර්ගෝපදේශන ලබා ගත හැකි අතර වැඩිදුර විස්තර සඳහා දුරකථන අංක 011-2686143, 011-691111- දිගු අංක 2430 ඔස්සේ එම මධ්‍යස්ථානය හා සම්බන්ධ විය හැක.

මෙම චක්‍රලේඛය කාර්ය මණ්ඩලයේ සියළු දෙනාටම දැන ගැනීමට සලස්වන ලෙස ඉල්ලා සිටින අතර එහි ඇතුළත් කරුණු ක්‍රියාත්මක කිරීමට වගබලා ගන්නා මෙන් ඉල්ලා සිටිමි. මේ සම්බන්ධයෙන් අවම වශයෙන් සුදුසු පරිදි එක් වැඩ සටහනක් හෝ සෑම ආයතනයක් විසින් ක්‍රියාත්මක කළ යුතුය.

ජාතික විෂ නිවාරණ සතිය වෙනුවෙන් ඔබ සේවා ස්ථානයේ සහ ප්‍රජාව තුල ක්‍රියාත්මක කරන ලද කටයුතු පිළිබඳව සවිස්තර වාර්තාවක් එම කාර්යයන් නිම කිරීමෙන් පසුව 2022 නොවැම්බර් 30 දිනට පෙර අධ්‍යක්ෂ / බෝනොවන රෝග ඒකකය, සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

**වෛද්‍ය අසේල ගුණවර්ධන**
**සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්**
**සෞඛ්‍ය අමාත්‍යාංශය**
**"සුවසිරිපාය"**
**385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,**
**කොළඹ 10.**